# නාගරික ජානපදිකයන් අතර ශ්වසන රෝග ව්‍යාප්තිය සහ ආයුර්වේදීය ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රම තුළින් එය වැළැක්වීම පිළිබඳ අධ්‍යයනයක්

කොළඹ විශ්වවිද්‍යාලයීය දේශීය වෛදය විද්‍යායතනයේ දර්ශනපති (ආයුර්වේද) පශ්වාත් උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධනය

ටී. ඩී. එන්. කරුණාරත්න

සහාය උපදේශක
කොළඹ නැගෙනහිර නියෝජ්‍ය
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
වෛද්‍ය ආර්. එල්. ද සිල්වා විජයමුණි
එම්. ඩී. (රුසියාව)
එම්. පී. එච් (එක්සත් රාජධානිය)
එම්. සී. ජී. පී. (ශ්‍රී ලංකා)

උපදේශක
ස්වස්ථවෘත්ත අගද දෙපාර්තමේන්තු
ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
වෛද්‍ය කේ. සී පෙරේරා
ඩී.ඒ.එම්.එස් (ගෞරව. ශ්‍රී ලංකා)
එම්.ඩී. බරණැස

ස්වස්ථවෘත්ත අගද දෙපාර්තමේන්තුව
දේශීය වෛද්‍ය විද්‍යායතනය
කොළඹ
ශ්‍රී ලංකාව

1997

IIM LIB
18765PR

ලියාපදිංචි අංකය : M.Phil 94/35

# සාරාංශය

මිනිසාට ඉතා වැදගත් ඉන්ද්‍රිය පද්ධතියක් වන ශ්වසන පද්ධතිය හෙවත් ප්‍රාණවහ ස්‍රෝතස් හි හටගන්නා රෝග, ශ්‍රී ලංකාවේ බහුලව පවතින බව සංඛ්‍යාලේඛණ අධ්‍යයනයෙන් පෙන්වා දීම මෙම නිබන්ධන ය හැඳින්වීමෙ දී දක්වා ඇති අතර, පර්යේෂණ අරමුණුද එහි සඳහන්ව ඇත. ඉන්පසු මෙම පර්යේක්‍ෂණ අධ්‍යයනය පහත සඳහන් පරිදි පරිච්ඡේද හයකින් නිමාකර ඇත.

පළමු පරිච්ඡේදයේ ශ්වසන රෝග පිළිබඳ පූර්වාචාර්ය මත විමසුමකට ලක්කළ අතර, එහිදී ශ්වසන රෝග පිළිබඳව හා එම රෝග සඳහා චිකිත්සා ගැන කරුණු විමර්ෂණය කර ඇත. මේ අතරින් තමක ශ්වාස නිදන පංචකය හා චිකිත්සා පිළිබඳව, නිදන පරිවර්ජනය, ස්වේද, ප්‍රාණායාම හා කටුවැල්බටු පැණිය පිළිබඳව වැඩිදුර විමර්ෂණය කරන්නට යෙදුණි.

දෙවන පරිච්ඡේදයේ ක්ෂෙත්‍ර හා සායනික පර්යේෂණ ක්‍රමවේදය හඳුන්වා දී ඇත. එහි පර්යේෂණ නිර්ණායකයන් සහ ප්‍රතිඵල ඇගයීමේ ක්‍රමයන් ද දක්වා ඇත.

තුන්වන පරිච්ඡේදයේ, ක්ෂේත්‍ර හා සායනික පර්යේෂණ, නිරීක්ෂණ හා ප්‍රතිඵල දක්වා ඇත. එම ප්‍රතිඵල සංඛ්‍යාන ක්‍රම මගින් කරන ලද විශ්ලේෂන ද එහි සඳහන් කර ඇත.

හතරවන පරිච්ඡේදයෙන්, නිරීක්ෂණ හා ප්‍රතිඵල සාකච්ඡාවට භාජනය කර ඇත. නාගරික ජනපදයේ ශ්වසන රෝග ඉහල මට්ටමක පවතින බවත්, ඒවාට බලපාන හේතු ගැනත් ආයුර්වේද ප්‍රාථමික සංරක්ෂණක්‍රමතුළින් ශ්වසන රෝග වැළැක්විය හැකි බවත්, ඖෂධ ප්‍රතිකාර වලින් පමණක් කෙරෙන චිකිත්සා වලට වඩා, ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමද යොදාගනිමින් කරන ලද චිකිත්සා සාඵල්‍යතාවයෙන් වැඩි බවත්, තමක ශ්වාස පූර්ව ව්‍යාධිතත්ත්ව සුවකිරීමට ආයුර්වේද ප්‍රතිකාර සමත්වන බවත්, ජනතාව ආයුර්වේද ප්‍රතිකාර සඳහා උනන්දුවක් හා විශ්වාසයක් ඇති බවත් මෙහිදී සාකච්ඡා වී ඇත.

ඒ අනුව එළඹුනු නිගමන හා කළහැකි නිර්දේශ පස්වන පරිච්ඡේදයෙන් ද සාරාංශය හයවන පරිච්ඡේදයෙන් ද දක්වා ඇත.